# ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය

ජූලි - සැප්තැම්බර් 2018




*(කොළඹ වැලිකඩ බන්ධනාගාරයේ කාන්තා රැඳවියන් තමන්ට ලබා දෙන පහසුකම්වල අඩු බව සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සහ යහපැවැත්ම ගැන අනෙකුත් ඉල්ලීම් සම්බන්ධයෙන් උද්ඝෝෂණයේ නිරත වෙන අයුරු. ඡායාරූපය - රුක්මාල් ගමගේ, ඩේලි නිවුස්)*

INFORM
Human Rights Documentation Centre
www.ihrdc.wordpress.com
informcolombo@gmail.com

ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය ජූලි - සැප්තැම්බර්

© ඉන්ෆෝම් මානව හිමිකම් දත්ත කේන්ද්‍රය, 2018

කොළඹ, ශ්‍රී ලංකාව.

බ්ලොග් අඩවිය: https://ihrdc.wordpress.com/

ඊමේල් ලිපිනය: informcolombo@gmail.com

## ආවරණය කළ මාතෘකා

A. උතුරු නැගෙනහිර දමිළ ක්‍රියාකාරීන්ට සහ දේශපාලනඥයන්ට තර්ජන සහ බාධා

B. ජනමාධ්‍යවේදීන්ට සහ කතෘවරුන්ට පහරදීම්, බිය ගැන්නවීම් සහ සීමා

C. කලාව සහ සාහිත්‍යයට සීමා

D. අතුරුදහන්වීම්වලට එරෙහි ක්‍රියාකාරීන්ට පහරදීම් සහ තර්ජන

E. වෙනත් ආකාරයේ තර්ජන සහ බියවැද්දවීම්

ඉන්ෆෝම් 1990 දී පිහිටුවන ලද්දේ ශ්‍රී ලංකාවේ විශේෂයෙන්ම ජනවාර්ගික අර්බුදය සහ යුද්ධය යන සන්දර්භයේදී මානව හිමිකම් තත්වය ගැන අධීක්ෂණය සහ ලේඛනගත කිරීමට මෙන්ම ප්‍රාදේශීය, ජාතික සහ අන්තර්ජාතික තලයන්හිදී ලිඛිතව සහ වාචිකව එම තත්වය වාර්තා කිරීමටයි .එසේම ඉන්ෆෝම් සිය අයිතිවාසිකම් නිතර සහ ක්‍රමානුකූල ලෙස උල්ලංඝණය වෙන අනෙකුත් ප්‍රජාවන් සමග ද වැඩ කර ඇත. වර්තමානයේ, ඉන්ෆෝම් ඡන්ද නිරීක්ෂණය, ප්‍රකාශනයේ නිදහස සහ මානව හිමිකම් ක්‍රියාධරයන් ඉලක්ක කර ගනිමින් වැඩ කරයි. ශ්‍රී ලංකාවේ, කොළඹ පිහිටා ඇති ඉන්ෆෝම් ආයතනය දේශීය ක්‍රියාධරයන්, කණ්ඩායම් සහ ජාල සමග මෙන්ම, කලාපීය) ආසියානු, සහ අන්තර්ජාතික මානව හිමිකම් ජාල සමග ද කිට්ටුවෙන් කටයුතු කරයි .

# පටුන


ක්‍රමවේදය ....................................................4

විධායක සාරාංශය ....................................................4

A. උතුරු නැගෙනහිර දමිළ ක්‍රියාකාරීන්ට සහ දේශපාලනඥයන්ට තර්ජන සහ බාධා ....................................................5

1. ධීවර ක්‍රියාකාරිකයාගේ බෝට්ටුවට ගිනි තැබේ....................................................5
2. යුද හමුදා බුද්ධි අංශ විසින් ප්‍රාදේශීය සභා මන්ත්‍රීට තර්ජනය කරයි....................................................6
3. දෙමළ ජාතික ජනතා පෙරමුණේ )TNPF( කාර්යාලය වටලයි....................................................6
4. කරච්චි ප්‍රාදේශීය සභාවේ සභාපති රහස් පොලිසියට කැඳවයි ....................................................6
5. වවුනියා පුරවැසි කමිටුවේ සභාපති ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය වෙත කැඳවයි....................................................7
6. හර්තාල් සංවිධායක අත්අඩංගුවට ....................................................7
7. පොලීසිය තිලීපන් සමරුවට එරෙහිව අතුරු තහනමක් ඉල්ලයි ....................................................7

B. ජනමාධ්‍යවේදීන්ට සහ කතෘවරුන්ට පහරදීම්, බිය ගැන්නවීම් සහ සීමා....................................................8

8. ජනමාධ්‍යවේදීන් දෙදෙනෙකුට හිරිහැර ....................................................8
9. රිවිර සහකාර කතෘ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය )TID වෙත (කැඳවයි ....................................................9
10. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දෙමළ පුවපත්පත්වල කතෘවරු සහ ජනමාධ්‍යවේදීන් ප්‍රශ්න කිරීම ......9
11. ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID) දෙමළ පුවත්පත් කතෘවරුන්ගෙන් ප්‍රකාශ ලබා ගනී....................................................10
12. ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID) මඩකලපුවේ ජනමාධ්‍යවේදියා කැඳවයි....................................................10
13. ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID) යාපනය ජනමාධ්‍යවේදියා කැඳවයි ....................................................11
14. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) විසින් යාපනය ජනමාධ්‍යවේදියා කැඳවයි....................................................11
15. යුද හමුදාව මුලතිවු හි ජනමාධ්‍යවේදීන්ගෙන් ප්‍රශ්න කරයි....................................................12
16. දෙමළ ජනමාධ්‍යවේදීන් සම්බන්ධයෙන් වාර්තා තබා ගන්නා බවට හමුදාව පිළි ගනී....................................................12
17. යාපනයේ ජනමාධ්‍යවේදිනියක් පහර දීමකට ලක්වේ ....................................................12
18. රජයේ වෛද්‍ය නිලධාරි සංගමයේ සභාපති ජනමාධ්‍යවේදීන්ට තර්ජනය කරයි ....................................................12
19. ජනපති ස්ත්‍රී දූෂණ, මිනීමැරුම් සහ මත්ද්‍රව්‍යවල වැඩි වීමට සමාජ මාධ්‍යවලට බැන වදියි....................................................13
20. සමූහ මිනීවළ ඡායාරූප ගත කිරීමට ජනමාධ්‍යවේදීන්ට තහනමක්....................................................13
21. නඩුව ආවරණය කිරීමට ජනමාධ්‍යවේදීන්ට තහනමක් ....................................................14

C. කලාව සහ සාහිත්‍යයට සීමා ....................................................15

22. නීතිය සහ සාමය අමාත්‍යවරයා දෙමළ සිනමාවට ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය කිරීම ගැන බැන වදී....................................................15
23. කතුවරයා සහ පොත් ප්‍රකාශක අත්අඩංගුවට....................................................16
24. ගුවන් විදුලි නාට්‍යය තහනම් කිරීම....................................................16
25. “මම කෙළින් මිනිහෙක්” වේදිකා නාට්‍යය තහනමට ....................................................17

**D.** අතුරුදහන්වීම්වලට එරෙහි ක්‍රියාකාරීන්ට පහරදීම් සහ තර්ජන ........ 18

26. අතුරුදහන් වූවන්ගේ පවුලක් වෙත පහර දීමට තැත්කිරීම සහ ඔවුන්ගෙන් ප්‍රශ්න කිරීම ........ 18
27. හමුදාවට විරුද්ධ අතුරුදහන්වීමේ නඩුවට සහය දෙන ක්‍රියාකාරිනියට පහර දීමක් ........ 18
28. අතුරුදහන්වීම්වලට විරුද්ධව වැඩ කරන ක්‍රියාකාරිකයා අත්අඩංගුවට ........ 18
29. නාවික හමුදාවට එරෙහි නඩුවේ ප්‍රධාන සාක්කිකරුගෙන් පළි ගැනීම් ........ 19
30. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී අතුරුදහන් වීම්වලට සම්බන්ධ බවට තොරතුරු සැපයූ සාක්ෂිකරුට මරණ තර්ජන 19

**E.** වෙනත් ආකාරයේ තර්ජන සහ බියවැද්දවීම් ........ 20

31. මානව හිමිකම් ක්‍රියාකාරිනියට ප්‍රහාරයක් ........ 20
32. විරෝධතා දක්වන කාන්තා රැඳවියන්ට ප්‍රහාර ........ 21
33. යුද හමුදාපති තමන්ගේ සංහිඳියා වැඩහිඳියා වැඩ විවේචනය කරන අයට තර්ජනය කරයි ........ 22
34. මානව හිමිකම් කොමිසමේ සභාපතිට තර්ජන ........ 23
35. කතෝලික කාදිනල් මානව හිමිකම් විවේචනය කරයි ........ 24

## ක්‍රමවේදය

මේ වාර්තාව විසින් 2018 ජූලි - සැප්තැම්බර් කාලයේ දී ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය සම්බන්ධයෙන් සාමාන්‍ය රටාවන් සහ සුවිශේෂී සිදුවීම් ගැන විස්තර සපයයි. විධායක සාරාංශයෙන් සන්දර්භය විස්තර කෙරෙන අතර, රටාවන් විශ්ලේෂණය කර, රජයේ සහ වෙනත් පාර්ශ්වවල චර්යාව ගැන පොදු සොයා ගැනීම් ඉදිරිපත් කරයි. මේ වාර්තාවේ සුවිශේෂී සිද්ධි 35ක් මාතෘකා 5ක් යටතේ ගොනු කර ඇත. මාධ්‍ය වාර්තා, ඉන්ෆෝම් වෙත වාර්තා වූ සිද්ධි, ඉන්ෆෝම් කාර්ය මණ්ඩලයේ අත්දැකීම් සහ නිරීක්ෂණ මෙහි තොරතුරු මූලාශ්‍ර වේ.

## විධායක සාරාංශය

ඉන්ෆෝම් විසින් මේ වසරේ පළ කළ ජනවාරි-මාර්තු, සහ අප්‍රේල්- ජූනි විසම්මුතිය මර්දනය වාර්තාවල සිද්ධි 22 සහ 18 බැගින් පිළිවෙළින් පළ වූ අතර, මේ මාස තුනේදී එම ගණන 35 දක්වා දෙගුණයක් බවට පත්ව තිබේ.

මේවායෙන් අඩක් පමණ උතුරු නැගෙනහිර දමිළ ක්‍රියාකාරීන්ට විරුද්ධවය. ඒ අතරට ජනමාධ්‍යවේදීන්, කතෘවරු, අතුරුදහන්වූවන්ගේ පවුල්, අතුරුදහන්වීම්වලට එරෙහි ව්‍යාපාරවලට සහයෝගය දක්වන ක්‍රියාකාරීන්, සහ දෙමළ දේහපාලනඥයන් අඩංගු වේ. මර්දනයේ ස්වරූපය කායික පහරදීම්, ප්‍රශ්න කිරීම, පොලිසියට විශේෂයෙන්ම ත්‍රස්ත විමර්ශන අංශයට(TID) කැඳවීම අඩංගු විය. මේ පළිගැනීම් පසුපස හමුදාව ද සිටින ලදී.

මීට අමතරව දෙමළ ජනමාධ්‍යවේදීන් සහ කතෘවරු සහ වෙනත් ජනමාධ්‍යවේදීන් සහ කතෘවරු ප්‍රශ්නකිරීම්වලට, හිරිහැර, බිය ගැන්වීම් ආදියට ලක් කර ඇත්තේ දේශපාලනඥයන්ගෙන් සහ වෘත්තීය සමිති නායකයකුගෙන් ඇතුළු අය විසිනි.

එසේම කලාව හා සාහිත්‍යය සීමා කරමින් පොත් සහ නාට්‍ය කෘති තහනම් කිරීම්, කලාකරුවන් අත්අඩංගුවට ගැනීම්, ප්‍රශ්න කිරීම්, බිය ගැන්නවීම් ආදිය ගැන ද වාර්තා විය. මේ බොහොමයක් චෝදනා පදනම් වූයේ ඒවායේ අන්තර්ගතය විසින් රටේ බහුතර ආගම වන බුද්ධාගම ගැන විවේචනාත්මක සහ හානිකර වෙනවාය යන තර්කය පදනම් කර ගනිමිනි. දේශපාලනඥයෝ සහ බෞද්ධ භික්ෂූහු මේවායෙන් සමහරක් සිද්ධි පිටුපස සිටියහ.

තර්ජනයට පාත්‍රවූ අය අතර මානව හිමිකම් කොමිසමේ සභාපති ආචාර්ය දීපිකා උඩගම ද සිටී. එසේම කොළඹ කතෝලික අගරදගුරු මැල්කම් කාඩිනල් රංජිත් විසින් මානව හිමිකම් රාමුව විවේචනය කරමින් ප්‍රසිද්ධ ප්‍රකාශ නිකුත් කරන ලදී. මේ සිද්ධි දෙකම මානව හිමිකම් ක්‍රියාධරයන්ගේ තදබල විවේචනයට ලක් විය.

වින්දිතයන් කිහිප දෙනෙක් කාන්තා ක්‍රියාකාරීන්ය. මේ අතරට මානව හිමිකම් කොමිසමේ සභාපතිනි, නැගෙනහිර අතුරුදහන් වූ පුද්ගලයකුගේ බිරිඳ, උතුරේ අතුරුදහන්වූවන්ගේ පවුල්වලට සහයෝගය දෙන ක්‍රියාකාරිනියක්, උතුරේ ජනමාධ්‍යවේදිනියක් සහ දකුණේ වදහිංසාවට පාත්‍ර වූ වින්දිතයන් සමග වැඩ කරන ක්‍රියාකාරිනියක් ද අඩංගු වේ. ඉහත ඒවායෙන් හතරක් කායික පහර දීම් වෙන අතර, එක් අවස්ථාවක දී යන්තමින් බේරී තිබුනි. මේ අතරින් වඩාත්ම අමානුෂික ප්‍රහාරයක් වන්නේ තමන්ගේ අයිතිවාසිකම් සහ මූලික අවශ්‍යතා වෙනුවෙන් විරෝධතා කළ කාන්තා රුදවියන්ට කළ පහරදීමයි.

## A. උතුරු නැගෙනහිර දමිළ ක්‍රියාකාරීන්ට සහ දේශපාලනඥයන්ට තර්ජන සහ බාධා

උතුරු පළාත අතිශයින් මිලිටරිකරණය වීම අඛණ්ඩව සිදු වෙන අතර, මේ වසරේ සහ පසුගිය වසරවල යුද්ධයෙන් මිය ගිය අය සඳහා ස්මාරක සහ සිහිපත්කිරීම් ඇතුළුව විවිධ කාරණා ගණනාවක් සම්බන්ධයෙන් විරෝධතා ගණනාවක් පැවැත්වුනි. නැගෙනහිර පළාතේ ද මීට සමාන ක්‍රියාකාරීත්වයක් දක්නට ලැබුනි. මේ සන්දර්භය තුළ, දමිළ ක්‍රියාකාරීන්ට සහ දේශපාලනඥයන්ට අඛණ්ඩව බොහෝ බාධා කිරීම්, තර්ජන, බිය ගැන්නවීම් සහ ආවේක්ෂණය රටේ අනෙකුත් පළාත්වලට වඩා අත්දැකීමට සිදු විය. පහත දැක්වෙන්නේ මාධ්‍යවල වාර්තා වූ එවැනි පළි ගැනීම් 7ක් සම්බන්ධ විස්තර වෙන අතර, මේ වාර්තාවේ තේමා වශයෙන් වෙන්කර ඇති අනෙකුත් සිද්ධීන්ද උතුරු නැගෙනහිර විසම්මුතිය මර්දනයට සම්බන්ධ වෙන අවස්ථා තිබේ.

### 1. ධීවර ක්‍රියාකාරිකයාගේ බෝට්ටුවට ගිනි තැබේ



*(රූපය- ගිනි තැබූ බෝට්ටුව - පින්තූරය - ටැමිල් ගාඩියන් www.tamilguardian.com )*

උතුරේ ධීවර අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියාකාරීව කටයුතු කරන, දමිළ ධීවරයකු වන සුජීපන් සෙබමාලේට අයිති ධීවර බෝට්ටුවක් ජූලි 21 වැනිදා, යාපනයේ වඩමාරච්චි නැගෙනහිර ප්‍රදේශයේ කඩ්ඩායික් කාඩුහි, මුල්ලියන්හි දී ගිනි තබා තිබුනු බවට වාර්තා වේ. මේ සිද්ධිය සිදු වී ඇත්තේ නාවික හමුදා ඛණ්ඩයට ආසන්න ස්ථානයක වන අතර, සිදු වූ අලාභය ඇස්තමේන්තුගත ආකාරයට රුපියල් 400,000කි. වඩමාරච්චි නැගෙනහිර ප්‍රදේශයේ මහා පරිමාණයේ මුහුදු කූඩැල්ලන් ඇල්ලීමේ කටයුතු නිසා ධීවර පරිසර පද්ධතිය විනාශ වීම සහ ධීවර ජීවිකාවට සිදුවන සෘණාත්මක බලපෑම ගැන සිදු කළ විරෝධතාවලට සුජීපන් විසින් නායකත්වය ලබා දී ඇත[1].

[1]https://www.tamilnet.com/art.html?catid=13&artid=39137 (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 3 වැනිදා)

2. යුද හමුදා බුද්ධි අංශ විසින් ප්‍රාදේශීය සභා මන්ත්‍රීට තර්ජනය කරයි

නල්ලූර් ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයකු වන එස් සිවලෝගනාදන් මහතා විසින් පවසන්නේ වසර ගණනාවක් තිස්සේ යුද හමුදාව විසින් අල්ලා ගෙන සිටින ඉඩම් නිදහස් කිරීම ආදිය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට යෝජනා ගෙන ඒම වැනි තමන්ගේ මහජන කටයුතු නිසා තමන්ට යුද හමුදා බුද්ධි අංශ විසින් දුරකථනය හරහා තර්ජනය කළ බවයි. ඔහු චෝදනා කරන්නේ දුරකථනයෙන් කතා කළ අය තමන් යුද හමුදා බුද්ධි අංශ බවට හඳුනා ගත් බවත්, තර්ජනාත්මක ස්වරයකින් ශ්‍රී ලංකා හමුදාවට විරුද්ධව යෝජනා ගෙන එන්නේ මන්දැයි තමන්ගෙන් ප්‍රශ්න කළ බවත්ය[2].

3. දෙමළ ජාතික ජනතා පෙරමුණේ (TNPF) කාර්යාලය වටලයි




*(රූපය-TNPF විසින් නිකුත් කළ ට්විටර් පණිවුඩය- [https://mobile.twitter.com/TnpfOrg/status/1030353557151772673?p=v](https://mobile.twitter.com/TnpfOrg/status/1030353557151772673?p=v))*

දෙමළ ජාතික ජනතා පෙරමුණේ (TNPF) මුලතිවු කාර්යාලය අගෝස්තු 16 වැනිදා යුද හමුදාව විසින් වටලන ලද බවට වාර්තා වේ. පක්ෂයේ ආරංචි මාර්ගවලට අනුව යුද හමුදා සොල්දාදුවන් කණ්ඩායමක් විසින් තම පක්ෂයේ මුලතිවු දිස්ත්‍රික් කාර්යාලය පැය ගණනාවක් තිස්සේ වටකර ගෙන සිට ඇති අතර, එයට බලෙන් ඇතුළු වී කාර්යාලය සෙවීමකට භාජනය කර ඇත[3]. පසුව TNPF විසින් මේ සිද්ධිය ගැන ට්වීට් පණිවුඩයක් නිකුත් කරමින් ප්‍රකාශ කළේ පක්ෂයේ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් මේ ගැන පොලීසියට පැමිණිල්ලක් කිරීමට ගිය අවස්ථාවේ 'ඇසින් දුටු සාක්ෂි මදි' යැයි කියමින් පැමිණිල්ල භාර ගැනීමට අකමැති බවක් පෙන්නුම් කළ බවයි. TNPF තවදුරටත් කීවේ යුද හමුදාව විසින් මෙසේ බලෙන් පක්ෂ කාර්යාලයට ඇතුළු වීම ඔවුන්ව බිය වැද්දවීමට සිදු කරන ලද නිර්ලජ්ජී වෑයමක් බවයි[4]. TNPF විසින් අතුරුදහන් වූවන්ගේ පවුල් විසින්, සහ හමුදාව විසින් අත්පත් කර ගෙන සිටින ඉඩම් අයිති ප්‍රජාවන් විසින් සංවිධානය කළ විරෝධතා කිහිපයකට සහයෝගය දක්වන ලදී.

4. කරච්චි ප්‍රාදේශීය සභාවේ සභාපති රහස් පොලීසියට කැඳවයි

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශීය සභාවේ සභාපති හට ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය වෙත කැඳවීමක් අගෝස්තු 29 වැනි දින කර තිබුනු අතර පසුව එය සැප්තැම්බර් 1 වැනි දිනට වෙනස් විය. ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් මෙසේ කැඳවීමට හේතුවක් දන්වා නැත. ඔහුව 2013 වසරේදී ද ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් රඳවා තබා ගෙන ඇත[5].

---

[2] https://www.tamilguardian.com/content/nallur-council-member-threatened-army-intel-bringing-resolutions-against-militarisation (අවසාන වරට ප්‍රවේශ වූයේ on 5st of ඔක්තෝබර්)
[3] https://mobile.twitter.com/TnpfOrg/status/1030353557151772673?p=v (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 6 වැනිදා)
[4] https://www.tamilguardian.com/content/sri-lankan-army-raids-tnpf-office-mullaitivu (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 6 වැනිදා)
[5] https://www.tamilguardian.com/content/tid-summons-karaichchi-divisional-council-chairman (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 1 වැනිදා)

### 5. වවුනියා පුරවැසි කමිටුවේ සභාපති ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය වෙත කැඳවයි

වවුනියා පුරවැසි කමිටුවේ සභාපති ගෝපාලක්‍රිෂ්ණන් රාජ්කුමාර් වෙත සැප්තැම්බර් 6 වෙනි දා ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් කැඳවීමක්කර තිබුනි. එහෙත් මෙසේ කැඳවීමට හේතුවක් දැනුම් දී නැත[6].

### 6. හර්තාල් සංවිධායක අත්අඩංගුවට

මඩකලපුවේ ක්‍රියාකාරිකයෙක් වන කනපතිපිල්ලෙයි මෝහන් එරාවුර් පොලීසියෙන් අත්අඩංගුවට ගෙන ඇත්තේ මහජන දේපළට හානි කිරීම යන චෝදනා එල්ල කරමිනි. මෝහන් ඇතුළු වෙනත් ක්‍රියාකාරීන්ගේ නායකත්වය ඇතුව එරාවූර් ආසන්නයේ වතුර බෝතල් කම්හලක් ඉදි කිරීමට විරුද්ධව ඔවුන් හර්තාල් විරෝධතාවයක් සංවිධානය කර තිබුනි. මෝහන් සැප්තැම්බර් 11 වැනිදා අත්අඩංගුවට ගෙන පසුව ඇප පිට නිදහස් කර ඇත[7].

### 7. පොලීසිය තිලීපන් සමරුවට එරෙහිව අතුරු තහනමක් ඉල්ලයි



*(තිලීපන් සමරුව - ඡායාරූපය- ටැමිල් ගාඩියන් www.tamilguardian.com )*

31 වසරකට පෙර ඉන්දීය සාම හමුදාවලට එරෙහිව සිය මරණය තෙක් උපවාසයක නියැලි තිලීපන් සැමරීමට එරෙහිව ජූලි 21 වැනිදා පොලීසිය විසින් අතුරු තහනම් නියෝගයක් ඉල්ලා සිටිමින් නඩුවක් පැවරූ බවට මාධ්‍ය වාර්තා පළ විය. තිලීපන් පෙර එල්ටීටීඊ සාමාජිකයෙකි. යාපනය දිස්ත්‍රික්කයේ නල්ලූර් හිදී සැප්තැම්බර් 26 වෙනිදා මේ සිහිපත් කිරීමේ උළෙල සැලසුම් කර තිබුනි. පොලීසිය විසින් කියා සිටියේ යාපනයට පැමිණෙන සිංහල සංචාරකයන් බියපත් විය හැකි බැවින් සහ වාර්ගික සහ ආගමික සංහිඳියාවට උපද්‍රව පැමිණිය හැකි බැවින් මෙම උළෙල තහනම් කළ යුතු බවත්, තිලීපන් ස්මාරකයේ සැරසිලි ඉවත් කළ යුතු බවත්ය. අතුරුතහනම් නියෝගය නිකුත් කිරීම සැප්තැම්බර් 25 වැනි දා උසාවිය විසින් ප්‍රතික්ෂේප කරන ලදී[8]. ඊට පසුදින මේ සිහිපත් කිරීමේ උළෙල යාපනයේ නල්ලූර් කන්දස්වාමි දේවාලය අසල යාපනය නගරාධිපති, දේශපාලනඥයන් සහ කිලිනොච්චි, මුලතිවු සහ යාපනය ප්‍රදේශවල වැසියන්ගේ සහභාගිත්වයෙන් සිදු කෙරිනි[9].

---

[6] https://www.tamilguardian.com/content/tid-summons-vavuniya-citizens-committee-president (අවසාන වරට ප්‍රවේශ වූයේ සැප්තැම්බර් 1 වැනිදා)
[7] https://www.tamilguardian.com/content/organiser-released-bail-over-batticaloa-hartal(අවසාන වරට ප්‍රවේශ වූයේ සැප්තැම්බර් 1 වැනිදා)
[8] https://www.tamilguardian.com/content/jaffna-court-rejects-ban-thileepan-commemoration (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 6 වැනිදා)
[9] http://www.dailymirror.lk/article/Jaffna-Mayor-at-Thileepan-s-commemoration-156035.html (අවසාන වරට ප්‍රවේශ වූයේ නොවැම්බර් 16 වැනිදා)

## B. ජනමාධ්‍යවේදීන්ට සහ කතෘවරුන්ට පහරදීම්, බිය ගැන්නවීම් සහ සීමා

මේ කාලය ඇතුළත ජනමාධ්‍යවේදීන් සහ කතෘවරු කිහිප දෙනෙක් ප්‍රශ්න කිරීම සහ ප්‍රකාශ ලබා ගැනීමට පොලිසිය සහ විශේෂයෙන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් කැඳවනු ලැබුනි. එක් අයකු හැර අන් සියල්ලන්ම උතුරු නැගෙනහිර දමිළ ජනමාධ්‍යවේදීන් වේ. එක් අවස්ථාවක දී යුද හමුදාව විසින් දෙමළ ජනමාධ්‍යවේදීන් සහ ක්‍රියාකාරීන් පිරිසක් හමුදාව සම්බන්ධයෙන් පල කළ මාධ්‍ය වාර්තා සම්බන්ධයෙන් ප්‍රශ්න කර ඇත. කොළඹ ජනමාධ්‍යවේදීන් දෙදෙනෙකුට ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාවකට දායක වීම සම්බන්ධයෙන් විවේචන එල්ල කරන ලද අතර, ජනමාධ්‍යවේදීන් සමූහ මිනීවල සහ ප්‍රසිද්ධ දේශපාලනඥයකුගේ දූෂණ සිද්ධි සම්බන්ධ නඩුවක් වාර්තා කිරීමෙන් සීමා කරන ලදී. මේ කාලයේ යාපනයේ දෙමළ ජනමාධ්‍යවේදියකු සම්බන්ධයෙන් බුද්ධි අංශ වාර්තා තබා ගත් බවට හමුදාව පිළිගත් අතර, යාපනයේ ජනමාධ්‍යවේදිනියකට නළ කායික පහරදීමක් ද, ජනාධිපති විසින් මත්ද්‍රව්‍ය, මිනීමැරුම් සහ ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය වෙත බැන වැදීමක් ද සිදු විය. එසේම රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ (GMOA) සභාපති විසින් ජනමාධ්‍යවේදීන්ට විරුද්ධව තර්ජනාත්මක ප්‍රකාශ කළ බවට ද වාර්තා වේ.

### 8. ජනමාධ්‍යවේදීන් දෙදෙනෙකුට හිරිහැර





*(ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රී කාංචන විජේසේකර මාධ්‍ය සාකච්ඡාවක් අමතමින් ජනමාධ්‍යවේදීන් දෙදෙනාට බැන වදින ලදී (වමේ) දරීශා බැස්ටියන්ස් (මැද) ආතර් වමනාන් (දකුණේ). ඡායාරූප දායකත්වය- www.colombotelegrap.com, jdssrilanka.blogspot.com, www.hirunews.lk)*

කාංචන විජේසේකර සහ ඩලස් අලහප්පපෙරුම ආදී හිටපු ජනපති මහින්ද රාජපක්ෂට සම්බන්ධ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමක් විසින් නිව්යෝක් ටයිම්ස් පුවත්පත විසින් හම්බන්තොට වරාය ගැන සිදු කළ ගවේෂණාත්මක වාර්තාවට දායකත්වය දැක් වූ ජනමාධ්‍යවේදීන් දෙදෙනකු වන දරීශා බැස්ටියන්ස් සහ ආතර් වමනාන් ප්‍රසිද්ධියේ විවේචනයක කරන ලදී. මෙම පුවත්පත් ලිපිය පුවත්පතේ දකුණු ආසියානු වාර්තාකරු වන මාරියා අබි හබීබ් විසින් ලියන ලදුව ජුනි 25 වැනිදා ප්‍රකාශයට පත් විය[10,11]. 2015 රාජපක්ෂගේ පරාජයට පත් වූ ජනාධිපති ඡන්ද ව්‍යාපාරයට චීන ආධාර ලැබුණු බව ආදී විවිධ කාරණා ගැන නිව්යෝක් ටයිම්ස් පුවත්පතේ පළ වූ එම ලිපියේ සොයා ගැනීම්වලට විරුද්ධව හිටපු ජනපති මහින්ද රාජපක්ෂ මහතා ජූලි 1 වැනිදා ප්‍රකාශයක් නිකුත් කරන ලදී. ජූලි 2 වැනිදා කොළඹ පැවැති මාධ්‍ය සාකච්ඡාවක දී, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් මේ ජනමාධ්‍යවේදීන්ට දෙදෙනාට බැන වැදීම සහ විවේචනය කිරීම සිදු කළ අතර, බැස්ටියන්ස්ගේ ඡායාරූපයක් ද පෙන්වන ලදී. මේ සිදුවීම මාධ්‍ය නිදහසට සිදු කළ තර්ජනයක් ලෙස සලකමින් අන්තර්ජාතික සහ දේශීය මාධ්‍ය සංවිධාන කිහිපයක් විසින් හෙළා දකින ලදී[12].

---

[10] https://cpj.org/2018/07/sri-lankan-politicians-try-to-intimidate-journalis.php(අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)
[11] https://www.newsfirst.lk/2018/07/04/new-york-times-reacts-to-intimidation-by-mr-camp/(අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)
[12] http://www.ifj.org/nc/news-single-view/backpid/1/article/sri-lankan-lawmakers-intimidating-journalists-over-nyt-article/(අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)

### 9. රිවිර සහකාර කතෘ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID) වෙත කැඳවයි



*(තිස්ස රවීන්ද්‍ර පෙරේරා, ඡායාරූපය ඩේලි මිරර් www.dailymirror.lk)*

රිවිර ඉරිදා පුවත්පතේ සහකාර සංස්කාරක තිස්ස රවීන්ද්‍ර පෙරේරා මහතා ජූලි 20 වැනි දා ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID) විසින් කැඳවා ඇත්තේ එම පුවත්පතේ උතුරු නැගෙනහිර එල්ටීටීඊ ක්‍රියාකාරකම්වල වර්ධනයන් සම්බන්ධයෙන් පළ වූ ලිපියක් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සිදු කිරීමටය. ලිපියේ මුලතිවු දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන් වෙතින් හමුවූ වල දමා තිබූ ක්ලේමෝ බෝම්බ සම්බන්ධයෙන් වාර්තා කර තිබුනි. “අපි මෙය හෙළි දරව් කළේ බුද්ධි අංශ වාර්තා පදනම් කර ගෙනයි. එල්ටීටීඊ නැවත නැගිටීම සම්බන්ධයෙන් කිසියම් ලකුණක් තියෙනවා ඒ ගැන මහජනතාව දැන ගත යුතුයි. අපි ඉටු කළෙ ජනමාධ්‍යවේදීන් ලෙස අපිට ඇති සමාජ වගකීමයි” තිස්ස රවීන්ද්‍ර පෙරේරා සිය ප්‍රකාශය ලබා දීමෙන් අනතුරුව මාධ්‍ය වෙත ප්‍රකාශ කරන ලදී[13].

### 10. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දෙමළ පුවපත්පත්වල කතෘවරු සහ ජනමාධ්‍යවේදීන් ප්‍රශ්න කිරීම

පොලීසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) විසින් යාපනයේ ජනමාධ්‍යවේදීන් සහ කතෘවරු කිහිප දෙනෙක් එල්ටීටීඊය සම්බන්ධයෙන් හිටපු රාජ්‍ය ඇමැති විජයකලා මහේෂ්වරන් විසින් සිදු කළ ආන්දෝලනාත්මක ප්‍රකාශයක් සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමට ලක් කර ඇත[14].

---

[13] http://www.dailymirror.lk/article/tid-records-statement-from-rivira-associate-editor-152985.html(අවසාන වරට ප්‍රවේශ වූයේ සැප්තැම්බර් 5 වැනිදා)

[14] https://www.tamilguardian.com/content/sri-lankas-cid-investigates-tamil-newspapers-reported-vijayakalas-speech (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 6 වැනිදා)

11. **ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID) දෙමළ පුවත්පත් කතෘවරුන්ගෙන් ප්‍රකාශ ලබා ගනී**

සැප්තැම්බර් 16 වැනි දින, ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID) යාපනයේ පුවත්පත් 3ක කතෘවරුන්ගෙන් ප්‍රකාශ සටහන් කර ගෙන ඇත. ආනයිකොට්ටයි දේවාල උත්සවයේ දී දමිළ නිජබිම පෙන්වන සිතියමක් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් උදයන්, වාලම්පුරි සහ තිනක්කුරල් පුවත්පත්වල කතෘවරුන්ගෙන් මෙසේ ප්‍රකාශ සටහන් කර ගෙන ඇත[15].

12. **ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID) මඩකලපුවේ ජනමාධ්‍යවේදියා කැඳවයි.**




*(රූපය - මඩකලපුව දිස්ත්‍රික්ක දෙමළ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ ප්‍රධානියා සහ නිදහස් ජනමාධ්‍යවේදී වී ක්‍රිෂණකුමාර්)*

මඩකලපුව දිස්ත්‍රික්කයේ දෙමළ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ ප්‍රධානියා සහ නිදහස් ජනමාධ්‍යවේදියකු වන වී ක්‍රිෂ්ණකුමාර් ජුලි 16 වෙනිදා ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය වෙත කැඳවූ බවට වාර්තා වේ. ඔහුට පොලීසියෙන් චෝදනා කළේ පෙර එල්ටීටීඊ නායකයන් සහ ඩයස්පෝරා සංවිධාන සමග සම්බන්ධතා පවත්වන බවටයි. ක්‍රිෂ්ණකුමාර් ට අනුව, ඔහු සහ මඩකලපුවේ පෙර එල්ටීටීඊය අතර සම්බන්ධය තදබල ලෙස ඔහුගෙන් ප්‍රශ්න කර ඇත. "ඔවුන් මගෙන් එල්ටීටීඊය සහ ඩයස්පෝරා සංවිධානවලට ඇති සම්බන්ධය විමර්ශනය කරනවා නම්, එයින් උත්සාහ කරන්නේ අපේ මාධ්‍ය කටයුතු සීමා කිරීමටයි" ක්‍රිෂණකුමාර් මාධ්‍ය අමතමින් කියා සිටියේය[16].

[15]https://www.tamilguardian.com/content/tid-interviews-jaffna-editors-over-tamil-homeland-display (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 2 වැනිදා)
[16]https://www.tamilguardian.com/content/tid-interrogates-batticaloa-journalist (අවසාන වරට ප්‍රවේශ වූයේ සැප්තැම්බර් 30 වැනිදා)

### 13. ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID) යාපනය ජනමාධ්‍යවේදියා කැඳවයි


ශ්‍රී ලංකා පොලීසිය
SRI LANKA POLICE
MESSAGE FORM

*(ශාලින් මහතාට පොලිසියෙන් ලබා දුන් නොතීසිය - පින්තූරය - ටැමිල් ගාඩියන්)*

යාපනයේ දෙමළ ජනමාධ්‍යවේදියකු වන උදයරාසා ශාලින් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් කොළඹට කැඳවා ඇත්තේ යාපනය දිස්ත්‍රික්කයේ පිහිටි ඔහුගේ ගම වන ආනායිකොට්ටයි හි පිහිටි හින්දු දේවාලයක උත්සවයක දී ඊළාම් සිතියමක් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමටය. මේ කැඳවීම සිදු කර ඇත්තේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය සහ ප්‍රදේශයේ වෙනත් පොලිස් ස්ථාන විසින් මෙම සිද්ධිය ගැන පරීක්ෂණ සිදු කර සති ගණනකට පසුවය. ශාලින් මහතා මෙම දේවාලයේ කිසිම පරිපාලන කමිටුවක සාමාජිකයෙක් නොවේ. ශාලින් මහතාට අමතරව, දේවලයේ පූජකයා, තරුණ සංගමයේ සාමාජිකයන් මේ සිද්ධිය ගැන ප්‍රශ්න කිරීමට ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් කොළඹට කැඳවා ඇත[17].

### 14. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) විසින් යාපනය ජනමාධ්‍යවේදියා කැඳවයි

යාපනයේ පෞද්ගලික රූපවාහිනී නාලිකාවක වැඩ කරන දෙමළ ජනමාධ්‍යවේදියකු වන නඩරාජා කුහරාජා අගෝස්තු 24 වැනි දා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) වෙත කැඳවා ඇති බවට වාර්තා වේ. කැඳවීම් කර ඇත්තේ 2015 මැයි මාසයේ දී සිවලෝගනාදන් විද්‍යා නම් 18 හැවිරිදි පාසල් සිසුවිය කණ්ඩායම් ලිංගික දූෂණයට ලක් කර, මරා දැමීමට පසුව වරදකරු වූ “ස්විස් කුමාර්” අත්අඩංගුවට ගැනීම සහ ඇප දීම සම්බන්ධයෙන් වන පරීක්ෂණයක කොටසක් ලෙසය. මේ ජනමාධ්‍යවේදීන් එම සිද්ධිය සම්බන්ධයෙන් වාර්තා කර ඇත[18].

---

[17]https://www.tamilguardian.com/content/tid-summons-jaffna-journalist-along-5-others(අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)
[18]https://www.tamilguardian.com/content/tamil-journalist-summoned-cid (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)

### 15. යුද හමුදාව මුලතිවු හි ජනමාධ්‍යවේදීන්ගෙන් ප්‍රශ්න කරයි

ජූලි 29 වැනි දින යුද හමුදා නිලධාරීන් විසින් මුලතිවු හි ජනමාධ්‍යවේදීන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් ප්‍රශ්න කිරීමට ලක් කර ඇත්තේ මුලතිවු දිස්ත්‍රික්කයේ ව්‍යාපාර සහ කුටුම්භ සම්බන්ධයෙන් හමුදාව විසින් තොරතුරු එකතු කරන බවට සෙනසුරාදා පළ වූ ප්‍රවෘත්ති වාර්තාවලට පසුව ඒ සම්බන්ධයෙනි. ජනමාධ්‍යවේදීන්ට සහ ක්‍රියාකාරීන්ට අනුව, හමුදා නිලධාරීන් විසින් තමන්ගේ ක්‍රියාකාරකම් පුවත්පත්වල කෙසේ පළ වූයේ දැයි පැහැදිලි කරන ලෙස බල කර ඇත[19,20].

### 16. දෙමළ ජනමාධ්‍යවේදීන් සම්බන්ධයෙන් වාර්තා තබා ගන්නා බවට හමුදාව පිළි ගනී

දෙමළ ජනමාධ්‍යවේදීන් සම්බන්ධයෙන් බුද්ධි වාර්තා තබා ගන්නා බවට ශ්‍රී ලංකා යුද හමුදාව පිළිගෙන ඇත. මේ තොරතුරු හෙළි දරව් වූයේ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ වූ අභියාචන ක්‍රියාදාමයක දී, යාපනයේ ජනමාධ්‍යවේදියකු විසින් ඉදිරිපත් කළ තොරතුරු දැන ගැනීමේ ඉල්ලීමක් හමුදාව විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් පසුවය. හමුදාව විසින් තොරතුරු දැන ගැනීමේ කොමිසම වෙත දැනුම් දී ඇත්තේ ඔවුන් විසින් මෙම ජනමාධ්‍යවේදියා විසින් ඉදිරිපත් කළ තොරතුරු දැන ගැනීමේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කර ඇත්තේ ඔහු සම්බන්ධයෙන් හමුදා බුද්ධි අංශ විසින් තබා ගන්නා වාර්තා පදනම් කර ගෙන බවයි[21].

### 17. යාපනයේ ජනමාධ්‍යවේදිනියක් පහර දීමකට ලක්වේ

යාපනයේ නිදහස් ජනමාධ්‍යවේදිනියක් වන දෙමළ ජාතික සුමති තංගරාජා සැප්තැම්බර් 28 වැනි දින තම මෝටර් සයිකලයෙන් ගමන් කරමින් සිටියදී මෙසේ පහර දීමකට ලක් වී ඇත. ඇය පවසන ආකාරයට, ආගමික ස්ථානයේ සිට සිය නිවසට ආපසු යමින් සිටියදී නොදන්නා පුද්ගලයකු වෙනත් මෝටර් සයිකලයක නැගී ඇය පසුපස පැමිණෙන බව ඇය දැක ඇත. මේ නොදන්නා පුද්ගලයා ඔහුගේ මෝටර් සයිකලය ඇගේ සයිකලයේ හප්පා, ඇයට තර්ජනය කර ඇත. මේ සම්බන්ධයෙන් ඇය යාපනය පොලිසියේ පැමිණිල්ලක් ගොනු කර ඇති අතර ඇය කම්පනයට ලක් වී ඇති අතර ඇගේ මෝටර් සයිකලයට ද හානි වී ඇත[22].

### 18. රජයේ වෛද්‍ය නිලධාරි සංගමයේ සභාපති ජනමාධ්‍යවේදීන්ට තර්ජනය කරයි



*(වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය - ඡායාරූපය - සන්ඩේ ඔබ්සවර්)*

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපති, වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය විසින් මව්බිමේ අරමුණට විරුද්ධව වැඩකරන ජනමාධ්‍යවේදී ද්‍රෝහීන්ගේ ලැයිස්තුවක් තමන් ප්‍රකාශයකට පත් කිරීමට සූදානම් බව ප්‍රකාශ කර ඇත. "අපි ලකුණු ක්‍රමයක් හදලා තියෙනවා. මනෝවිද්‍යාවේ, රට පවාලා දෙන පුද්ගලයන් හඳුනාගන්නා ක්‍රමයක් තියෙනවා. අපි මේ ලැයිස්තුව අන්තර්ජාලයේ තියනවා ඔවුන් ප්‍රකාශයට පත් කරන දේවලුත් එක්ක. අපිට පෙන්නුම් කරන්න පුළුවන් ඔබ රටට විරුද්ධව කොන්ත්‍රාත්තුවක් ඉටු කරනවා කියා" යැයි වෛද්‍ය පාදෙනිය මහතා ජූලි 4 වැනිදා

[19] https://www.tamilguardian.com/content/journalists-questioned-over-coverage-army-collecting-information-mullaitivu(අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)

[20] https://www.tamilguardian.com/content/residents-fear-sl-army-collects-information-mullaitivu (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)

[21] https://www.tamilguardian.com/content/sri-lankan-army-admits-holding-military-intelligence-report-tamil-journalist (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 6 වැනිදා)

[22] https://www.tamilguardian.com/content/tamil-journalist-attacked-jaffna-0 (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 6 වැනිදා)

කොළඹ දී පැවසූ බවට වාර්තාවේ. ඔහු 'සන්ඬේ ඔබ්සවර්' ඉංග්‍රීසි පුවත්පතේ ජනමාධ්‍යවේදියකුට දුරකථනයෙන් ජූලි 3 වැනි තර්ජනය කරමින් කියා ඇත්තේ සන්ඬේ ඔබ්සවර් පුවත්පතේ ජනමාධ්‍යවේදීන් රට විකුණන බවයි[23].

### 19. ජනපති ස්ත්‍රී දූෂණ, මිනීමැරුම් සහ මත්ද්‍රව්‍යවල වැඩි වීමට සමාජ මාධ්‍යවලට බැන වදියි



*(ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන. ඡායාරූපය -, vaguthu.mv)*

ජනපති මෛත්‍රීපාල සිරිසේන විසින් මිනීමැරුම්, ස්ත්‍රී දූෂණ සහ මත්ද්‍රව්‍යවල වැඩිවීම සම්බන්ධයෙන් සමාජ මාධ්‍යවලට බැන වැදුනු බවට වාර්තා වේ. "සමහරක් සමාජ වෙබ් අඩවි සහ නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතා කිරීම නිසා ස්ත්‍රී දූෂණ සහ මිනීමරුම් වැඩි වෙලා තියෙනවා. වගකීම රජයෙන් ගන්න ඕනා වාගේම දෙමාපියන්ටත් වගකීමක් තියෙනවා මේ වාගේ නරක දේවල් දරුවන් බේරා ගන්න" යැයි ජනපති සිරිසේන මහතා ජූලි 11 වැනිදා නුවර දී පැවැති ප්‍රසිද්ධ උත්සවයක දී ප්‍රකාශ කර ඇත[24].

### 20. සමූහ මිනීවළ ඡායාරූප ගත කිරීමට ජනමාධ්‍යවේදීන්ට තහනමක්

මන්නාරමේ පිහිටි සමූහ මිනීවළේ ඡායාරූප ගැනීම තහනම් කරමින් මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණය විසින් සියලු ජනමාධ්‍යවේදීන්ට විරුද්ධව තහනමක් පනවා ඇති බවට වාර්තා වේ. මෙම මිනීවළ දැනට හාරමින් පවතින අතර, සිරුරු 235කට වඩා වැඩි ප්‍රමාණයක් සොයා ගෙන ඇති අතර, ඒ අතර දරුවන් 18 දෙනෙකු ද ඇතුළු ය[25]. සමහරක් ඇටසැකිලි වල අස්ථිවල "ගැඹුරු සහ අසාමාන්‍ය" විදාරණයන් හමු වී ඇත. උසාවිය පැවසුයේ ජනමාධ්‍යවේදීන්ට මේ තහනම පැනවූයේ කැණීම් කටයුතුවලට ඇති විය හැකි බාධා නැවැත්වීමට වන බවයි[26].

---

[23]http://srilankabrief.org/2018/08/sri-lanka-doctors-association-gmoa-head-threatens-journalists-with-traitors-list/( අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 6 වැනිදා)
[24]https://www.tamilguardian.com/content/sri-lankan-president-blames-social-media-%E2%80%98increase-murders-and-rapes%E2%80%99 (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 6 වැනිදා)
[25]https://www.tamilguardian.com/content/mannar-mass-grave-excavation-temporarily-suspended(අවසාන වරට ප්‍රවේශ වූයේ නොවැම්බර් 16 වැනිදා)
[26]https://www.tamilguardian.com/content/sri-lankan-court-bans-journalists-photographing-mannar-mass-grave (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)



*(මන්නාරම සමූහ මිනීවළ. රූපය –ශ්‍රී ලංකන් මිරර්)*

### 21. නඩුව ආවරණය කිරීමට ජනමාධ්‍යවේදීන්ට තහනමක්

හිටපු ඇමැති සහ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාට විරුද්ධ නඩුවක් වාර්තා කිරීමට ගිය ජනමාධ්‍යවේදීන්ට ඒ සඳහා අවසර ලැබී නැත. ඔහු සහ තවත් සැකකරුවන් දෙදෙනෙකුට රජයේ සිල්ලර වෙළෙඳ ආයතනය වන සතොසට අයිති මිලියන 5.2ක මුදලක් අවභාවිතා කිරීම ගැන චෝදනා එල්ල වී ඇත. සැකකරුවන් නඩුව අවසන් වන තුරු රිමාන්ඩ් භාරයට පත් කර තිබුනි. ජනමාධ්‍යවේදීන් කීවේ තමන්ට සැප්තැම්බර් 12 වැනි දා මේ තහනම ගැන පොලිස් නිලධාරියකු විසින් දැනුම් දුන් බවත්, ඉතා වැදගත් පුද්ගලයන් (VIPs) ලෙස හඳුනා ගත් තෝරාගත් පිරිසක අයට පමණක් උසාවි භූමියට ඇතුළු වීමට ඉඩ දුන් බවත් ය[27].

[27]http://srilankabrief.org/2018/09/sri-lanka-journalists-barred-from-covering-case-of-misappropriating-state-funds-by-a-minister/ (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)

## C. කලාව සහ සාහිත්‍යයට සීමා

අවමද් ලූතාශ කිරීමේ නිදහසට තර්ජන මේ මාස තුන ඇතුළත දකින්නට ලැබුනේ පොත් ප්‍රකාශකයකු සහ කතුවරයකු අත්අඩංගුවට පත් වීමෙන්, වේදිකා නාට්‍යයක් වාරණයකට ලක් වීමෙන්, ගුවන් විදුලි නාට්‍යයක් තහනමට ලක් වීමෙන්, සහ ඇමැතිවරයෙක් දෙමළ සිනමාවට මත්ද්‍රව්‍ය, මිනීමැරුම් සහ ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් බැන වැදීමෙනි. මේ සිද්ධි 4න් 3ක්ම පදනම් වූයේ ඒවා බුද්ධාගමට හානිකරය යන තර්කය පදනම් කර ගනිමිනි. බුද්ධාගම රටේ බහුතර ආගම වන අතර, ඇමතිවරු සහ බෞද්ධ භික්ෂූහු මේ සීමාවන් පසුපස සිටිති.

**22. නීතිය සහ සාමය අමාත්‍යවරයා දෙමළ සිනමාවට ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය කිරීම ගැන බැන වදී**




*(රූපය- අමාත්‍ය රංජිත් මද්දුම බණ්ඩාර, රූපය- ඩේලිමිරර් www.dailymirror.lk)*

නීතිය හා සාමය අමාත්‍යවරයා වන රංජිත් මද්දුමබණ්ඩාර විසින් උතුරේ විශේෂයෙන්ම තරුණ කණ්ඩායම් අතර ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් දෙමළ සිනමාවට බැන වැදී ඇති බවට වාර්තා වේ. ජූලි 13 වැනිදා කොළඹ දී ඔහු කීවේ, උතුරේ කළ ‘තොරතුරු සෙවීමේ ගමනකට’ පසුව සොයා ගත්තේ දෙමළ චිත්‍රපටි හේතුවෙන් යාපනයේ කල්ලි ප්‍රචණ්ඩත්වය ඇති වන බවයි. දෙමළ තරුණයන් තමන්ගේ කොල්ලකෑම් වැනි අපරාධ ක්‍රියාකාරකම් සිදු කිරීමට පළමුව දෙමළ තරුණයන් ප්‍රචණ්ඩ රූපරාමු අනුකරණය කරනවා” යනුවෙනි.[28,29]

[28] https://www.tamilguardian.com/content/sri-lankas-law-and-order-minister-blames-tamil-cinema-gang-violence (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)

[29] http://www.dailymirror.lk/152689/-Ava-gangsters-influenced-by-violence-in-Tamil-films-Minister( අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)

### 23. කතුවරයා සහ පොත් ප්‍රකාශක අත්අඩංගුවට




*(රූපය- වමේ, අමාත්‍ය විජයදාස රාජපක්ෂ, පොතේ කවරයේ ඡායාරූපයක් , කතෘ ශ්‍රීනාත් චතුරංග, ප්‍රකාශකයා උපුල් සන්නස්ගල - ඡායාරූප- www.gossiplanka.com)*

ජනප්‍රිය කතෘ සහ පොත් ප්‍රකාශක උපුල් ශාන්ත සන්නස්ගල සහ කතෘ ශ්‍රීනාත් චතුරංග "බුදුන්ගේ රස්තියාදුව" නම් පොතක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් පොලීසිය විසින් අත්අඩංගුවට ගත් බව වාර්තා වේ. පොත ලියා ඇත්තේ ශ්‍රීනාත් චතුරංග විසින් වන අතර එය මුද්‍රණය සහ බෙදා හැරීම සිදු කර ඇත්තේ උපුල් සන්නස්ගලයි. මේ දෙදෙනාම මිරිහාන පොලිසිය විසින් පොත් සිය ගණනක් සමග අත්අඩංගුවට ගෙන ඇත්තේ පොත එළි දැක්වීමට මඳ වේලාවකට පෙර, බෞද්ධ තොරතුරු කේන්ද්‍රය යැයි කියා ගන්නා පිරිසකගේ පැමිණිල්ලක් පදනම් කර ගෙනයි. දෙදෙනාම චෝදනා ගොනු කිරීමකින් තොරව නිදහස් කළ නමුත්, පොතේ කතුවරයාට සහ මුද්‍රණකරුට මාධ්‍ය හරහා බෞද්ධ භික්ෂූන්, දේශපාලනඥයන්, සහ එවැනි පාර්ශ්ව කිහිපයක් මගින් වාචිකව අපයෝජනය කරන ලදී. උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමැති විජයදාස රාජපක්ෂ විසින් තම නිල ලිපි සිරැසියක පොලිස්පතිට ලිපියක් ලියමින් මේ පොතේ කතෘට සහ මුද්‍රණකරුට විරුද්ධව නීති පියවර ගන්නා ලෙස ඉල්ලා තිබේ[30, 31].

### 24. ගුවන් විදුලි නාට්‍යය තහනම් කිරීම

රජයට අයිති සහ ස්වාධීන රූපවාහිනී සේවය හරහා කළමණාකරණය වූ, ජාතික ඒකාග්‍රතා සහ සංහිඳියාව සම්බන්ධ අමාත්‍යාංශය යටතේ ඇති ජාතික සමගිය සහ සංහිඳියාව සම්බන්ධ කාර්යාලය හරහා අනුග්‍රාහකත්වය ලබා දී විකාශනය කිරීමට තිබූ ගුවන් විදුලි නාට්‍ය මාලාවක් විජයදාස රාජපක්ෂ, ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇතුළු ඇමැතිවරු කිහිපදෙනෙකුගේ මැදිහත්වීම් නිසා තහනම් කළ බවට වාර්තා වේ. මෙම නාට්‍ය මාලාව අධ්‍යක්ෂණය කර ඇත්තේ ප්‍රසිද්ධ නාට්‍ය අධ්‍යක්ෂක මාලක දේවප්‍රිය විසින් වෙන අතර, පිළිගත් කලාකරුවන් කිහිප දෙනෙකුම මේ නාට්‍ය මාලාවට දායකත්වය ලබා දී ඇත. කෙසේ වුවත් මේ නාට්‍යමාලාව විවේචනය කළ බෞද්ධ භික්ෂූන් විසින් කිහිපනමක් විසින් ප්‍රකාශ කර ඇත්තේ එය බුදු දහමට අගෞරව කරන බවත්, ඒ නිසා තහනම් කළ යුතු බවත්ය. බෞද්ධ කටයුතු ඇමැති ගාමිණී ජයවික්‍රම පේරේරා මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කරන මෙන් ඔහුගේ නිලධාරීන්ට උපදෙස් ලබා දී තිබේ[32].

---

[30] http://www.hirunews.lk/198018/legal-action-to-be-taken-against-book-titled-budunge-rasthiyaduwa (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 6 වැනිදා)

[31] http://www.asianmirror.lk/news/item/28054-cultural-minister-requests-police-chief-to-take-action-against-author-publisher-and-distributors-of-budunge-rasthiyaduwa(අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)

[32] http://srilankabrief.org/2018/08/kanata-paharak-radio-drama-banned-as-ordered-by-buddha-sasana-and-religious-affairs-minister/( අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)

## 25. “මම කෙළින් මිනිහෙක්” වේදිකා නාට්‍යය තහනමට



*(අසංක සායක්කාර, සිදු වෙමින් පවතින කලාකාරුවන් සහ ලේඛකයන්ට එරෙහි වාරණයට විරුද්ධව කලාකාරුවන් සහ ක්‍රියාකාරීන් කණ්ඩායමක් සංවිධානය කළ මාධ්‍ය සාකච්ඡාවක් අමතමින්, අගෝ 23, කොළඹ දී)*

“මම කෙළින් මිනිහෙක්” අසංක සායක්කාරගේ වේදිකා නාට්‍යය එය බුද්ධාගමට අපහාස කරතැයි යන පදනම මත ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය මගින් තහනම් කර ඇතැයි වාර්තා වේ. මේ නාට්‍යය ‘වැඩිහිටියන්ට පමණයි’ යන ලේබලය යටතේ වර්ග කර ඇති අතර, එය වාර කිහිපයක් වේදිකාවේ රඟ දක්වා ඇත. හදිසියේම වාරණ මණ්ඩලය විසින් එහි සහතිකය නැවත කැඳවා ඇත්තේ සමහර දර්ශන බුද්ධාගමට අපහාස කරන නිසාය. මේ චෝදනාව අධ්‍යක්ෂක සායක්කාර විසින් ප්‍රතික්ෂේප කර ඇත. සමහරක් දර්ශන ඉවත් කිරීමේ පදනම පසුව තහනම ඉවත් කරනු ලැබිණි[33] [34].

[33]http://www.rivira.lk/online/2018/08/25/158168 (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 6 වැනිදා)
[34]https://srilankamirror.com/entertainment-mirror/10081-mang-kelin-minihek-to-be-banned(අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 6 වැනිදා)

## D. අතුරුදහන්වීම්වලට එරෙහි ක්‍රියාකාරීන්ට පහරදීම් සහ තර්ජන

උතුරු නැගෙනහිර දමිළ ජනවාර්ගික අතුරුදහන් වූවන්ගේ පවුල් 2017 මුල භාගයේ පටන් ගත් විරෝධතා 2018 දක්වාම දින 600ත් ඉක්මවා යමින් අඛණ්ඩව පැවැතුනි. අනෙකුත් අතුරුදහන් වූවන්ගේ පවුල් විසින් පොත් ප්‍රකාශයට පත් කර ඇති අතර, අලුත් නඩු පවරා ඇත. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සැසිවලට ද දැනුම් දී ඇත. මෙයින් ක්‍රියාකාරීත්වය වැඩි වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස තර්ජන, බියගැන්වීම් සහ ඇතැම් අවස්ථාවලදී අතුරුදහන් වූවන්ගේ පවුල්වලට සහ ඔවුන්ට සහය දෙන අයට සිදු කළ පහර දීම් ද සිදු විය. නාවික හමුදාවේ සාක්ෂිකරුවන් දෙදෙනෙක් විසින් පරීක්ෂකයන් සමග සහයෝගයෙන් කටයුතු කිරීමට පටන් ගත් පසුව තමන්ට පළිගැනීම්වලට මුහුණ දීමට සිදු වූ බවට නාවික හමුදාව සම්බන්ධ තරුණයන් 11 දෙනෙකු අතුරුදහන් වීම සම්බන්ධ නඩුවේ දී පැමිණිලි කර ඇත. පහත දැක්වෙන්නේ වාර්තාවෙන් ආවරණය වන පසුගිය මාස තුන ඇතුළත සිදු වූ එවැනි සිද්ධිවල උදාහණ කිහිපයකි.

### 26. අතුරුදහන් වූවන්ගේ පවුලක් වෙත පහර දීමට තැත්කිරීම සහ ඔවුන්ගෙන් ප්‍රශ්න කිරීම

දමිළ, කාන්තා, අතුරුදහන්වීම් සම්බන්ධ ක්‍රියාකාරිනියක් ජූලි 10 නැගෙනහිර පළාතේ ඇගේ නිසවස අසලදී, ඇය සිය පුතු සමග ගමන් කරමින් සිටිය දී පහර දීමට ලක් විය. ඇයට අනුව මිනිසුන් දෙදෙනෙක් ඇය දෙසට යකඩ පොල්ලක් විසිකර ඇත. ඇගේ සැමියා අතුරුදහන් වී ඇති අතර, ඇය ඔහු වෙනුවෙන් අනෙකුත් අතුරුදහන් වූවන්ගේ පවුල් සමග අරගල කරමින් සිටී. මේ සිද්ධිය සිදු වන්නේ ඇය ජිනීවාහි, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සැසිවලට ගොස් ආපසු පැමිණ දින කිහිපයකට පසුවය. ජූලි 6 වැනිදා ඇගේ නිවසට පැමිණි රහස් පොලිස් නිලධාරීන් විසින් ඇයව ප්‍රශ්න කිරීමට බඳුන් කර ඇත්තේ, ඇය ජිනීවා ගියේ ඇයි, ඇය එහි ප්‍රකාශ කළේ මොනවා දැයි සම්බන්ධයෙනි. ඇය එසේම කීවේ ජිනීවා සිට ආපසු පැමිණෙන විට, තමන්ගේ ගමන් මල්ල කොළඹ ගුවන් තොටුපළේ දී අනවශ්‍ය ලෙස ප්‍රමාද වූ බවත්, එහිදී තමාව වෙනම කාමරයකට ගෙන ගොස් තමන් පැමිණෙන්නේ කොහේ සිට ද, ඇගේ සූට්කේසයේ සහ ලැප්ටොප් පරිගණකයේ තිබෙන්නේ මොනවාදැයි ප්‍රශ්න කළ බවත්ය[35].

### 27. හමුදාවට විරුද්ධ අතුරුදහන්වීමේ නඩුවට සහය දෙන ක්‍රියාකාරිනියට පහර දීමක්

අතුරුදහන් වූවන්ගේ පවුල්වලට සහ ඔවුන්ගේ හමුදාවට විරුද්ධ හබයාස් කෝපස් නඩු කිහිපයක නීතිඥයන්ට සහය ලබා දෙන ක්‍රියාකාරිකයෙකුට සහ අමානුෂික ලෙස යකඩ පොල්ලකින් කළ පහර දීමක්, ජූලි 14 වැනිදා යාපනයේ වඩ්ඩුකොඩ්ඩායි වෙතින් වාර්තා වේ. ඇය ඇගේ තරුණ පුතු සමග බයිසිකලයක යමින් සිටියදී මෙසේ නාඳුනන පුද්ගලයකු විසින් යකඩ පොලු පහරක් දී ඇත. මේ සිද්ධිය සිදු වී ඇත්තේ පොලිස් ස්ථානයක් අසලය. සිද්ධියෙන් පසුව මුහුණේ සහ හිසේ තුවාල සහිතව ඇයව රෝහල්ගත කර ඇත. 1996 දී, ශ්‍රී ලංකා යුද හමුදාව විසින් රඳවා ගැනීමෙන් පසුව, දෙමළ තරුණයන් 24කට වැඩි ගණනක් අතුරුදහන් වීම සම්බන්ධයෙන් යාපනය උසාවියේ නඩුවක් විභාග වේ[36].

### 28. අතුරුදහන්වීම්වලට විරුද්ධව වැඩ කරන ක්‍රියාකාරිකයා අත්අඩංගුවට

සම අයිතිය ව්‍යාපාරයේ ක්‍රියාකාරිකයෙකු වන යසිත් චන්දිම, කළුතර දිස්ත්‍රික්කයේ හොරණ පොලීසිය විසින්, අගෝස්තු 27 වැනිදා මධ්‍යම රාත්‍රියේදී අත්අඩංගුවට ගෙන ඇත්තේ ඔහු අගෝස්තු 30 වෙනිදාට යෙදෙනු අන්තර්ජාතික අතුරුදහන්වූවන්ගේ දිනය සම්බන්ධයෙන් පෝස්ටර් අලවමින් සිටියදීය. පෝස්ටර් ව්‍යාපාරය

[35]https://www.tamilguardian.com/content/tamil-disappearances-activist-attacked-days-after-cid-harassment (අවසාන වරට ප්‍රවේශ වූයේ සැප්තැම්බර් 30 වැනිදා)
[36]https://www.tamilguardian.com/content/lawyers-assistant-brutally-attacked-jaffna (අවසාන වරට ප්‍රවේශ වූයේ සැප්තැම්බර් 30 වැනිදා)

මේ දිනය සැමරීමට සිදු කළ එක් ක්‍රියාකාරකමක් වෙන අතර, දේශපාලන සිරකරුවන් සහ අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් සටන් පාඨ අඩංගු විය[37].

### 29. නාවික හමුදාවට එරෙහි නඩුවේ ප්‍රධාන සාක්කිකරුගෙන් පළි ගැනීම්



*(ලුතිනන් කොමදෝරු ක්‍රිෂාන් වෙලගෙදර, ඡායාරූප දායකත්වය - සන්ඩේ ඔබ්සවර්)*

නාවික හමුදාව විසින් තරුණයන් 11 දෙනෙකු අතුරුදහන් කිරීම සම්බන්ධ නඩුවේ ප්‍රධාන රජයේ සාක්කිකරුවකු වන ලුතිනන් කොමදෝරු ක්‍රිෂාන් වෙලගෙදර, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට ලිපියක් ලියමින්, තමන්ගේ සේවායෝජකයා වන නාවික හමුදාව විසින්, තමන්ට ලබා දිය යුතු උසස්වීම් නොලැබීම වැනි පළි ගැනීම්වලට තමන් ලක් කරන බවට දැනුම් දී ඇතැයි වාර්තාවේ. මේ නඩුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශනය කර ගෙන යමින් පවතින අතර, පුළුල් මාධ්‍ය ආවරණයක් ලැබී ඇති අතර, සැකකරුවන් ලෙස නාවික නිලධාරීන් අත්අඩංගුවට පත් වී ඇත. විමර්ශන අතරතුර, ලුතිනන් කොමදෝරු වෙලගෙදර ප්‍රකාශ කළේ තමන් අතුරුදහන් වූ තරුණයන් නාවික හමුදා භාරයේ සිටින විට දුටු බවත්, ඔවුන්ට පහර දී තිබුනු බවත්, ඔවුන් බේරා ගන්නා ලෙස තමන්ට ආයාචනය කළ බවත්ය[38].

### 30. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී අතුරුදහන් වීම්වලට සම්බන්ධ බවට තොරතුරු සැපයූ සාක්ෂිකරුට මරණ තර්ජන

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන කොට්ඨාශය (CID) සැප්තැම්බර් 26 වැනිදා කොටුව මහේස්ත්‍රාත් උසාවියට දැනුම් දී ඇත්තේ ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරී ලුතිනන් කොමදෝරු ගලගමගේ ලක්සිරි හට ඉහළ නිලධාරීන්ගෙන් මරණ තර්ජන එල්ල වී ඇති බවයි. තරුණයන් 11 දෙනෙකුගේ අතුරුදහන් වීමට අදාළ නඩුවේ නාවික හමුදාවේ සැකකරුවකුට අත්අඩංගුවෙන් ගැලවී පලා යාමට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී අද්මිරාල් රවී විජේගුණරත්න සහාය ලබා දුන් බවට තොරතුරු සැපයූ සාක්කිකරු වන්නේ ඔහුය[39].

[37]https://www.lankaviews.com/mer-activist-arrested/ (අවසාන වරට ප්‍රවේශ වූයේ සැප්තැම්බර් 4 වැනිදා)
[38]http://srilankabrief.org/2018/09/key-witness-in-students-abduction-case-petitions-hrcsl-claims-navy-is-victimising-him/ (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 8 වැනිදා)
[39]http://www.ft.lk/news/Key-witness-giving-evidence-of-CDS--involvement-in-youth-abduction-case-receives-death-threats/56-663546(අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා )

## E. වෙනත් ආකාරයේ තර්ජන සහ බියවැද්දවීම්

මානව හිමිකම් සහ මානව හිමිකම් ක්‍රියාධරයන්ට විරුද්ධව තර්ජන සහ බිය ගැන්නවීම් විවිධ ආකාරවල මේ කාලය තුළ අඛණ්ඩව සිදු වූ අතර, ආගමික නායකයන්, හමුදා නායකයන් මානව හිමිකම් හා මානව හිමිකම් ක්‍රියාධරයන්ට එරෙහිව ආන්දෝලනාත්මක ප්‍රකාශ සිදු කරන ලදී. පහත දැක්වෙන්නේ වාර්තා වූ සිද්ධි සමහරකි.

### 31. මානව හිමිකම් ක්‍රියාකාරිනියට ප්‍රහාරයක්



*(රූපය- අමිතා ප්‍රියන්ති, ඡායාරූප දායකත්වය - සන්ඩේ ඔබ්සවර්)*

කොළඹ දිස්ත්‍රික්කයේ පානදුර පිහිටා ඇති ජනසංසදය කණ්ඩායමට සම්බන්ධ මානව හිමිකම් ක්‍රියාකාරිනයක් වන අමිතා ප්‍රියන්ති හට, සම්පූර්ණයෙන්ම මුහුණ ආවරණය කළ හෙල්මට් සහිත, කලු හැඳ ගත්, මෝටර් බයිසිකල් කරුවන් දෙදෙනෙක් විසින් ජූලි 6 වැනිදා කලුතර දිස්ත්‍රික්කයේ අලුත්ගම මොරගවල ප්‍රදේශයේදී පහර දී ඇත්තේ ඇය තම නිවස වෙත යමින් සිටිය දී ය. පහර දුන් අය ඇගේ බෑගය පැහැර ගෙන ඇති අතර, එහි මානව හිමිකම් නඩුවලට සම්බන්ධ සංවේදී තොරතුරු සහ ඇගේ ජංගම දුරකථනය තිබී ඇත. මේ ගැන පොලිසියට පැමිණිල්ලක් කර ඇති අතර, පහරදුන් අයගේ මෝටර් බයිසිකලේ අංකය හඳුනා ගෙන ඇත. ජනසංසදය විශේෂයෙන්ම වද හිංසාවට ලක් වූ වින්දිතයන් සම්බන්ධයෙන් ප්‍රසිද්ධ මානව හිමිකම් සංවිධානයකි[40].

[40]http://www.ahrchk.org/ruleoflawasia.net/news.php?id=AHRC-STM-039-2018 (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 7 වැනිදා)

## 32. විරෝධතා දක්වන කාන්තා රැඳවියන්ට ප්‍රහාර




*(අඩු පහසුකම් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සහ යහපැවැත්ම ගැන අනෙකුත් කාරණා සම්බන්ධයෙන් විරෝධතා දක්වන කොළඹ වැලිකඩ බන්ධනාගාරයේ කාන්තා රැඳවියන්, ඡායාරූප දායකත්වය - රුක්මාල් ගමගේ, ඩේලි නිවුස්)*

කොළඹ වැලිකඩ බන්ධනාගාරයේ කාන්තා රැඳවියන් කණ්ඩායමකට ඇතැම් නිලධාරීන් විසින් බන්ධනාගාරය ඇතුළත දී සහ, වැලිකඩ බන්ධනාගාරයේ සිට වෙනත් බන්ධනාගාරයක් වෙත ගෙන යමින් තිබිය දී අමානුෂික ලෙස පහර දී ඇත. කාන්තා රැඳවියන් කණ්ඩායම සති දෙකකට වැඩි කාලයක් අඩු පහසුකම් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සහ යහපැවැත්ම ගැන අනෙකුත් කාරණා සම්බන්ධයෙන් උද්ඝෝෂණය කරමින් සිටියහ. බන්ධනාගාර අධිකාරීන් විසින් විරෝධතාවය විසුරුවා හරින ලද අතර, විරෝධතාකරුවන්ට අමානුෂික ලෙස පහර දුන් බවට වාර්තා වේ. විරෝධතාවය විසුරුවා හැරීමෙන් පසු, අගෝස්තු 20 වැනිදා කාන්තා රැඳවියන් 52ක් වැලිකඩ සිට වෙනත් බන්ධනාගාර වෙත මාරු කරන ලද අතර, එසේ ගෙන යාමේදී ඔවුනට බසය තුළදී පිරිමි බන්ධනාගාර නිලධාරීන් විසින් පහර දී ඇත. මාලි නම් වන 35 හැවිරිදි කාන්තා රැඳවියෙක් අගෝස්තු 24 වැනිදා මිය ගිය බවට වාර්තා වෙන්නේ පහර දීම් නිසාය.[41][42].

[41] https://srilankamirror.com/news/10230-assaulted-welikada-inmate-died-without-treatment(අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 8 වැනිදා)
[42] https://srilankamirror.com/news/10230-assaulted-welikada-inmate-died-without-treatment(අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 8 වැනිදා)

### 33. යුද හමුදාපති තමන්ගේ සංහිඳියා වැඩහිඳියා වැඩ විවේචනය කරන අයට තර්ජනය කරයි




*(රූපය- යුදහමුදාපති ලුතිනන් ජෙනරාල් මහේෂ් සේනානායක,ඡායාරූප දායකත්වය -ඒසියන් ට්‍රිබියුන් www.asiantribune.com)*

යුද හමුදාපති මහේෂ් සේනානායක විසින් සිදුවෙමින් පවතින සංහිඳියා යාන්ත්‍රණයට විශ්‍රාමික නිලධාරීන් ඇතුළුව තනි පුද්ගලයන්, සහ සිවිල් ක්‍රියාකාරීන් විසින් බාධා නොකිරීමට ඉඩ නොදීමට ශ්‍රී ලංකා යුද හමුදාවේ සියලු අංශ වෙත නියෝග ලබා දී ඇති බව වාර්තා වේ "අවස්ථාවාදී දේශපාලනඥයන් සහ ඇතැම් විශ්‍රාමික හමුදා නිලධාරීන් සහ සිවිල් ක්‍රියාකාරීන්, රජය සහ හමුදාව විසින් ගෙන යනු ලබන සංහිඳියා ක්‍රියාදාමය විවේචනය කරන ගමන් ත්‍රස්තවාදී ක්‍රියා අගය කරනවා, උතුරු නැගෙනහිර සාමයට කැමති ජනතාව විසින් රජය සහ හමුදාව කෙරේ තබා ඇති විශ්වාසය පළුදු කරන ආකාරයේ, වෛරයෙන් ඔවුන්ගේ මනස දූෂණය කරන ආකාරයේ දේශන සහ රැස්වීම් පවත්වනවා," යැයි හමුදාපතිවරයා විසින් කී බවට වාර්තා වේ. මෙය රජයේ සංහිඳියා යාන්ත්‍රණය, සිවිල් වැසියන්ගේ පෞද්ගලික සහ පොදු ඉඩම් අඛණ්ඩව අයිති කර ගැනීම, ගොවිපළ, පෙරපාසැල් ආදියට යුද හමුදාව සම්බන්ධ වීම, සහ ආවේක්ෂණය (surveillance) වැනි කාරණා සම්බන්ධයෙන් යුද හමුදාවේ භූමිකාව සම්බන්ධයෙන් විවේචනාත්මක වූ අයට කළ වක්‍ර තර්ජනයකි[43 44 45].

---

[43] http://www.colombopage.com/archive_18B/Jul09_1531105657CH.php (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)

[44] https://www.tamilguardian.com/content/army-commander-orders-troops-condemn-acts-obstructing-reconciliation (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)

[45] http://dbsjeyaraj.com/dbsj/archives/59924#more-59924 (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)

## 34. මානව හිමිකම් කොමිසමේ සභාපතිට තර්ජන




*(ආචාර්ය දීපිකා උඩුගම, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ සභාපති, කොළඹ දී පැවැති මාධ්‍ය හමුවක් අමතමින්. ඡායාරූප දායකත්වය - ඒසියා නිව්ස්)*

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ සභාපති ආචාර්ය දීපිකා උඩගම තර්ජනවලට ලක් වී ඇත්තේ ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත, ශ්‍රී ලංකා යුද හමුදාවේ එකඟතාවය මත ඇරඹූ පරීක්ෂණ ක්‍රියාදාමයක මානව හිමිකම් කොමිසමේ භූමිකාව නිසාය. ආචාර්ය දීපිකා උඩගමට එරෙහිව මේ තර්ජනයන් කරන ලද්දේ සිවිල් ආරක්ෂක බලකායේ හිටපු අධ්‍යක්ෂක ජෙනරාල් රෙයාර් අද්මිරාල් (විශ්‍රාමික) සරත් වීරසේකර විසිනි.[46]. ආචාර්ය උඩගම කොටින්ගේ අවශ්‍යතා වෙනුවෙන් ද්‍රෝහී ලෙස රාජ්‍ය නොවන සංවිධාන සමග වැඩ කරන බවට ද රෙයාර් අද්මිරාල් විසින් ප්‍රකාශ කර ඇති අතර, දේශප්‍රේමී රජයක් යටතේ සියලුම ද්‍රෝහීන්ට මරණ දඬුවම ලැබිය යුතු බව ද ඔහු ප්‍රකාශ කර ඇත[47]. පසුව අගමැතිවරයා මේ මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් මේ ද්වේශ සහගත ප්‍රකාශය හෙළා දුටු අතර, එසේම මේ ආකාරයේ තර්ජන සහ එවැනි වගකීම් විරහිත ප්‍රකාශ මුද්‍රිත මාධ්‍යවල ප්‍රකාශයට පත් කිරීම බරපතල කාරණයක් බව කියා සිටියේය. මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන ලෙස සහ මානව හිමිකම් කොමිසමේ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව තහවුරු කරන ලෙස ඔහු පොලිස්පතිවරයාට නියෝග කර ඇත [48].

මේ තර්ජන සිවිල් සමාජ සංවිධාන 37ක් සහ ශ්‍රී ලාංකිකයන් 170ක්, සහ අන්තර්ජාතික සත්‍යය සහ යුක්තිය ව්‍යාපෘතිය(ITJP) ඇතුළුව දේශීය සහ විදේශීය කණ්ඩායම් කිහිපයක් විසින් හෙළා දැක ඇත[49].

[46] http://www.dailynews.lk/2018/07/24/features/157726/traitors-and-patriots (අවසාන වරට ප්‍රවේශ වූයේ දෙසැම්බර් 4 වැනිදා)

[47] http://srilankabrief.org/2018/07/civil-society-calls-on-pm-president-to-publicly-express-their-confidence-in-the-chairperson-and-hrcsl/(අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)

[48] http://www.dailynews.lk/2018/07/20/local/157473/pm-wants-igp-probe-threat-against-deepika(අවසාන වරට ප්‍රවේශ වූයේ නොවැම්බර් 5 වැනිදා)

[49] https://www.tamilguardian.com/content/threats-against-sri-lanka%E2%80%99s-human-rights-commission-are-%E2%80%98absolutely-outrageous%E2%80%99-says-itjp (අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 5 වැනිදා)

35. කතෝලික කාදිනල් මානව හිමිකම් විවේචනය කරයි




*(රූපය- කාදිනල් මැල්කම් රංජිත් - වීඩියෝව –අද දෙරණ https://youtu.be/qTVqGUUOWNY)*

කොළඹ කතෝලික අගරදගුරු, කාදිනල් මැල්කම් රංජිත් විසින් ප්‍රකාශ කළේ මානව හිමිකම් යන්න පැමිණ ඇත්තේ මෑත දී බවත්, එය බටහිර ආගමක් වන බවත් කියමින්, මානව හිමිකම් යනු ආගමක් නැති අය සැලකිලිමත් විය යුතු මිථ්‍යාවක් බවත්, ආගමක් විශ්වාස කරන අය මානව හිමිකම් ගැන කතා කිරීමට අවශ්‍ය නැති බවත් ප්‍රකාශ කළේය.[50].කතෝලිකයන් කණ්ඩායමක් විසින් මේ අදහස ප්‍රසිද්ධියේ අභියෝගයකට ලක් කර ඇත්තේ, කතෝලික ඉගැන්වීම් සහ මානව හිමිකම් රාමුවට සහයෝගය දක්වන වත්මන් සහ හිටපු පාප් වහන්සේලා විසින් මානව අයිතිවාසිකම් සහ ප්‍රකාශන සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශ උපුටා දක්වමිනි[51].

[50]http://www.dailymirror.lk/article/Human-rights-is-the-latest-religion-among-Western-nations-Archbishop--155899.html( අවසාන වරට ප්‍රවේශ වූයේ ඔක්තෝබර් 8 වැනිදා)

[51] We are shocked at some of your recent comments, group of Catholics tell Malcolm Cardinal Ranjith.http://srilankabrief.org/2018/10/we-are-shocked-at-some-of-your-recent-comments-group-of-catholics-tell-malcolm-cardinal-ranjith/ ( අවසාන වරට ප්‍රවේශ වූයේ නොවැම්බර් 8 වැනිදා)